## 212 මල් ගොමු වල

මල් ගොමුවල දිය ඇලි ළඟ සෙව්වෙමි
කිමිදී දිය යට පියඹා ගුවන ද
සෙව්වෙමි මා කිතු සමිඳා
නැත එතුමා දුටුවේ මා //

මව්පිය නෑ මිතු සරණක් නොමැතිව
අනාථ වී ඔබ මොබ දුවමින් යන
දරුවන් හා මඟ යනවා
මා දුටුවා කිතු සමිඳා //

කුසගිනි නිවනට අහරක් හිඟමින
රෑය ගෙවුමට නිවනක් මඟ සොයමින
අසරණ වී සරණ පතා
අමතයි මා කිතු සමිඳා //